# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## වානේ තහඩු කැපීමේ යන්ත්‍ර 01 ක් සැපයීම, ස්ථාපනය කිරීම, සහ ක්‍රියාත්මක කරවීම සඳහා ප්‍රසම්පාදනය

## SRS /F. 8029

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත වානේ තහඩු කැපීමේ යන්ත්‍ර 01, සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කරවීමේ ප්‍රසම්පාදනය සඳහා දේශීය නිෂ්පාදකවරුන්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසු මෙහෙයැවේ.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට 2025/02/03 දින සිට 2025/03/04 දින දක්වා වැඩකරන දිනයන් හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී පහත දැක්වෙන ලිපිනයෙන් ලංසු ලිපි ලේඛන පරීක්ෂා කිරීම සහ වැඩිදුර තොරතුරු ලබාගැනීම සිදු කළ හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | | |
|---|---|---|
| **දුරකථන අංක** | : | **94(11)2438070 හෝ 94(11) 4600202** |
| **ෆැක්ස් අංකය** | : | **94 (11) 2432044** |
| **ඊ මේල්** | : | **srs.slr@gmail.com, tender1@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | : | **www.railway.gov.lk** |

04. ලංසුකරු විසින් ඉහත අයිතමය සැපයීම සඳහා තමන්ට ඇති හැකියාව සහ ශක්‍යතාව සනාථ කෙරෙන ලේඛන සමග ඉහත අයිතමය සැපයීමේ පෙර වාර්තා ඉදිරිපත් කළ යුතුය. (පසුගිය වසර 5 ක කාලය තුළ ශ්‍රී ලංකාව තුළ සමාන සන්නාමයේ යන්ත්‍ර මිලදී ගනු ලැබූ ගනුදෙනුකරුවන් 10 දෙනෙකුගේ තොරතුරු අවම වශයෙන් ඉදිරිපත් කළ යුතුය.)

නිෂ්පාදකවරයා සතුව අයිතමය සැලසුම් කිරීම සහ නිෂ්පාදනය සඳහා පිළිගත් ISO 9001 : 2008 තත්ත්ව සහතිකයක් තිබිය යුතු අතර ඉහත අයිතමය නිෂ්පාදනය/ සැපයීම සම්බන්ධයෙන් නිෂ්පාදකවරයා/ සැපයුම්කරු සතුව අවම වශයෙන් වසර 5 ක පළපුරුද්දක් තිබිය යුතුය. ඉහත කරුණු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි මිල ගණන් සමග ඉදිරිපත් කළ යුතුය.

05. ආපසු ගෙවනු නොලබන ප්‍රසම්පාදන ගාස්තු රුපියල් 2.875.00 **පමණක්** ගෙවීමෙන් හා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2025.02.03 දින සිට 2025.03.04 දින ප.ව. 3.00 දක්වා අභිලාෂී ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ ලංසුලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

06. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කරන ලද රු. 150,000.00 ක වටිනාකමින් යුත් කොන්දේසි විරහිත ඇපකරයක් ආකාරයේ ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය.

07. ලංසු 2025/03/05 දින ප.ව 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ලංසු විවෘතකරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ආරාධනා කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු පිළිනොගැනේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**යොමු අංකය : SRS/F. 8029**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**